Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## පානදුර ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා බඳවා ගැනීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පානදුර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති සෞඛ්‍ය පරිපාලක III ශ්‍රේණියේ ස්ථිර තනතුරු 01 ක් සඳහා විවෘත බඳවා ගැනීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

<table>
<tr><th>තනතුරු නාමය හා වැටුප් පරිමාණය</th><th>අධ්‍යාපන සුදුසුකම්</th><th>බඳවා ගැනීමේ ක්‍රමවේදය</th></tr>
<tr>
<td>සෞඛ්‍ය පරිපාලක III ශ්‍රේණිය<br><br>තනතුරු : 01<br><br>වැටුප් කේත අංකය MN I-2016<br>මාසික රු. 27,140 - 10 x 300 -11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540</td>
<td>සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම;<br><br>සහ<br><br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් ව තිබීම.</td>
<td>විවෘත බඳවා ගැනීම - සෞඛ්‍ය පරිපාලක III ශ්‍රේණිය<br><br>ලිඛිත විභාගය :<br>
<table>
<tr><th>විෂයයන්</th><th>කාලය</th><th>උපරිම ලකුණු ප්‍රමාණය</th><th>සමත් ලකුණු ප්‍රමාණය</th></tr>
<tr><td>අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය</td><td>පැය 01</td><td>100</td><td>40%</td></tr>
<tr><td>කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය</td><td>පැය 01</td><td>100</td><td>40%</td></tr>
</table>
<br>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :<br>මෙහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂාකර බැලීම සඳහා පමණක් පවත්වනු ලැබේ.</td>
</tr>
</table>

*1. බඳවා ගැනීමේ පොදු කොන්දේසි හා සේවා කොන්දේසි :*

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් හෝ පදිංචිය සනාථ කළ යුතුය.)

iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුයි.

iv. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

v. විශිෂ්ට චරිතයකින් හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

vi. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය නියමිත සුදුසුකම් සපුරා තිබීම අනිවාර්යය වේ.

vii. ආයතන සංග්‍රහය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, මුදල් රෙගුලාසි හා බස්නාහිර පළාත් සභාවේ කාර්යය පරිපාටික හා මූල්‍ය නීති, රෙගුලාසි හා නියෝගවලට ද පානදුර ප්‍රාදේශීය සභාව විසින් වරින්වරට නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

vii. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්ති තීරණයට ඔබ යටත් විය යුතුය.

ix. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ව තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය.

x. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා විධිවිධාන හා ඊට අනුශාංගික වන චක්‍රලේඛ විධිවිධාන අනුව මෙම පත්වීම භාරගත් දින සිට වසර 05ක් ඉකුත් වීමට පෙර අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

xi. ක්‍රීඩා කුසලතා/සෞන්දර්ය දක්ෂතා/පරිගණක හැකියාව ආදී වෙනත් බාහිර සුදුසුකම් හා දක්ෂතා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

2. *බඳවා ගැනීමේ ක්‍රමය :*

i. සෞඛ්‍ය පරිපාලක තනතුර සඳහා ලිඛිත විභාගයට අමතරව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් ද පැවැත්වේ.

ii. පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

iii. නියමිත දිනට පසුව ලැබෙන හෝ අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කෙරෙන හෝ සහතිකවල ඡායාපිටපත් අමුණා නැති හෝ අදාළ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iv. ඔබ විසින් සාවද්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලබන අතර එබඳු අසත්‍ය තොරතුරක් බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කරනු ලැබේ.

3. *අයදුම් කිරීමේ පිළිවෙළ :*

i. අයදුම්කරුවන් A4 ප්‍රමාණයේ කඩදසියක දෙපසම ප්‍රයෝජනයට ගනිමින්, ජීව දත්ත සහ අධ්‍යාපනික තොරතුරු ඇතුළත් කර තමා විසින්ම පිළියෙල කළ අයදුම්පතක් 2021.04.28 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, පානදුර ප්‍රාදේශීය සභාව, ගාලුපාර, වාද්දුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ii. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සෞඛ්‍ය පරිපාලක III ශ්‍රේණිය, විවෘත බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

4. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.

i. උප්පැන්න සහතිකය

ii. අධ්‍යාපන සහතික

iii. ජාතික හැඳුනුම්පත

iv. ශිෂ්‍ය කාර්ය දර්ශනය (පාසල හැරයාමේ සහතිකය)

v. පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රදේශීය ලේකම්ගේ සහතිකය

vi. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (මින් එකක් ග්‍රාම නිලධාරිගෙන් ලබා ගත යුතුය.)

5. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරදී හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ලේකම්,
ප්‍රාදේශීය සභාව.
ගාලු පාර,
වාද්දුව.

2021 අප්‍රේල් 01 වැනි දින,
පානදුර ප්‍රාදේශීය සභාවේ දී ය.